මීගමුව මහා නගර සභාව - 2024
----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මීගමුව මහා නගර සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට මීගමුව මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, 1.6.2 (උ) හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

1.6.1 **පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම**

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රමිතියේ 3 වන පරිච්ඡේදයේ 3.28 ජේදය අනුව මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී සමාලෝචිත වර්ෂයේ අතිරික්තය සඳහා රු.69,893,082 ක් ලෙස සිදු කර තිබුණු ගැලපීම කුමක්ද යන්නට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවූ අතර විස්තීර්ණ ආදායම් වියදම් ප්‍රකාශනයේ ගලපන ලද පොලී වියදම වූ රු.14,189,143 ක් අතිරික්තයට ගලපා නොතිබුණි.	පිළිගන්නා බව.	ප්‍රමිතියට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය .
(ආ)	ප්‍රමිතියේ 3 වන පරිච්ඡේදයේ 3.30 ජේදය අනුව මූල්‍ය ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී සමාලෝචිත වර්ෂය තුලදී දිගුකාලින ණය පොලී ලෙස රු.14,189,142 ක් ගෙවා තිබුණද එය මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබුණි.	පිළිගන්නා බව.	ප්‍රමිතියට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය .
(ඇ)	ප්‍රමිතියේ 3 වන පරිච්ඡේදයේ 3.26 ඡේදය අනුව සමාලෝචිත වර්ෂය අවසාන දිනට වූ රු.150,000,000 ක වටිනාකමැති සත්දින තැන්පතු වටිනාකම මුදල් හා මුදල් සමාන දෑ ලෙස දක්වා නොතිබුණි. මේ නිසා ජංගම වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.	ඉදිරියේ දී මෙවැනි වැරදි සිදු නොවීමට කටයුතු කරන බව.	ප්‍රමිතියට අනුකූලව මූල්‍ය ප්‍රකාශය පිළියෙල කළ යුතුය .
(ඈ)	ප්‍රමිතියේ 3 වන පරිච්ඡේදයේ 3.7 ඡේදය අනුව අයවැය ලේඛනවල අයවැයගත තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර නොතිබුණි.	2025 වර්ෂයේදී නිවැරදි කරන බව.	ප්‍රමිතියට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය .
(ඉ)	ප්‍රමිතියේ 6 වන පරිච්ඡේදයේ 6.20 ජේදය අනුව සෑම පන්තියක දේපළ පිරියත හා උපකරණ සඳහා අස්ථිත්වයක් විසින් භාවිතා කළ ක්ෂය කිරීමේ ක්‍රමය, වත්කමේ ප්‍රයෝජ්‍ය ජීවකාලය හෝ භාවිතා කළ ක්ෂය	ඉදිරියේ දී මෙවැනි වැරදි සිදු නොවීමට	ප්‍රමිතියට අනුකූලව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය .

	කිරීමේ අනුපාතය යන තොරතුරු හෙළිදරව් කර නොතිබුණි.	කටයුතු කරන බව.	
(ඊ)	ප්‍රමිතියේ 2 වන පරිච්ඡේදයේ 2.2 (ආ) ඡේදයට හා 2.4 ඡේදයට අනුකූල නොවී ඉදිකිරීම් සිදු කර නොතිබියදී අවස්ථා 35 කට අදාලව රු.480,517,019 ක් ඇස්තමේන්තු වටිනාකම පදනම්ව ණයහිමි ලෙස දක්වා තිබුණි.	ඉදිරියේ දී මෙවැනි වැරදි සිදු නොවීමට කටයුතු කරන බව.	ප්‍රමිතියට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය .
(උ)	ප්‍රමිතියේ 2 වන පරිච්ඡේදයේ 2.2 (අ) ඡේදයට හා 2.4 ඡේදයට අනුකූල නොවී වටිනාකම රු.18,637,433 ක් වූ සැපයුම්කරු විසින් වෙන්කර නොතිබූ සහ භෞතිකව ලැබී නොතිබූ භාණ්ඩ වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි.	එම භාණ්ඩ ස්ථානගත කළ පසු ගෙවීමට ණයහිමි වෙන්කළ බව.	ප්‍රමිතියට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය .
(ඌ)	2021 පෙබරවාරි 12 දිනැති අංක LGD/10A/4/න.ගි/2019 දරන පළාත් පාලන කොමසාරිස්ගේ ලිපිය අනුව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී ස්ථාවර වත්කම් බාණ්ඩ 14 ක් යටතේ වර්ගීකරණය කළ යුතු වුවත්, දේපල පිරියත හා උපකරණවල නිවැරදිව වත්කම් බාණ්ඩයන් හඳුනාගෙන ගිණුම්ගත කරනු වෙනුවට රු.29,225,439 ක් වෙනත් ලෙස ගිණුම්ගත කර තිබුණි.	2025 වර්ෂයේදී නිවැරදි කරන බව.	චක්‍රලේඛයට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2023 ජනවාරි මාසයේ ගිවිසුම්ගත වූ කාමච්චෝඩය පොදු වෙළඳපොල ඉදිකිරීම සඳහා මුල් ඇස්තමේන්තුව සියයට 50 කට සීමා කිරීම මත වටිනාකම රු.232,853,762 ක් වූ අතර 2024 දෙසැම්බර් 31 දින වන විට රු.116,426,881 ක වැඩ සහතික කර තිබුණි. ඒ අනුව නොනිමි වැඩ වටිනාකම රු.116,426,881 ක් විය යුතු වුවත් එය රු. 635,220,807 ක් ලෙස රු.518,793,926 ක් වැඩියෙන් ගිණුම් ගත කර තිබුණි.	ගෙවීම් සඳහා අවශ්‍ය අරමුදල් සම්පාදනය කර ගැනීමට ණයහිමි වෙන්කර ඇති බව.	නිවැරදි වටිනාකම් ගිණුම් තුළ ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	2023 සැප්තැම්බර් මස සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වියදම් මත ගෙවන ලද (යෙදවුම්) බදු රු.34,377,634 ක වටිනාකමක් ගිණුම්ගත කර නොතිබුණි.	2025 වර්ෂයේදී නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	ඇස්තමේන්තු වටිනාකම රු.626,821,982 ක් වූ නව පුස්තකාල ගොඩනැගිල්ල ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුවේ පලමු හා දෙවන බිල් මගින් රු.313,410,991 ක් ගෙවා තිබුණි. ඒ අනුව නොනිමි වැඩ වටිනාකම රු.313,410,991 ක් දැක්විය යුතු වුවත් එය රු.461,223,089 ක් ලෙස රු. 147,812,098 ක් වැඩියෙන් දක්වා තිබුණි.	ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ සඳහා ණයහිමි වෙන්කර ඇති බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය.

(ඇ)	සුහුරු නගර සංකල්පය බිහිකිරීමේ ඊ සේවාව සැපයීම වෙනුවෙන් ගෙවූ රු.2,450,000 ක් හා නෙක්ෆා මෘදුකාංගය සඳහා ගෙවූ රු.3,145,000 ක් පරිගණක මෘදුකාංග යටතේ දක්වනු වෙනුවට පරිගණක හා උපාංග යටතේ දක්වා තිබුණි.	ඉදිරියේදී නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය.
(ඉ)	සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු එකතුව රු.5,661,484 ක් සමාලෝචිත වර්ෂයේ විස්තීර්ණ ආදායම යටතේ දක්වනු වෙනුවට සමුච්චිත අරමුදල යටතේ දක්වා තිබුණි.	ඉදිරියේදී නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය.
(ඊ)	2021 වර්ෂයේ සිට 2023 වර්ෂය සඳහා මිලදීගෙන තිබුණු එකතුව රු.111,871,007 ක් වූ ස්ථාවර වත්කම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා වූ ක්ෂය වටිනාකම රු.11,242,872 ක් ගිණුම් ගත කර නොතිබුණි. ඒ අනුව අතිරික්තය හා ජංගම නොවන වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි.	2025 වර්ෂයේ ගිණුමෙන් නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය.
(උ)	ඉකුත් වර්ෂයේ විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව මඟින් පෙන්වා දී තිබූ වටිනාකම රු.244,569,493 ක් වූ ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කරන බව දක්වා තිබුණද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කර නොතිබුණි.	2025 වර්ෂයේ ගිණුමෙන් නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය.
(ඌ)	ඉකුත් වර්ෂවල ප්‍රාග්ධන ප්‍රදාන යටතේ අත්පත් කරගෙන තිබුණු වත්කම්වලට අදාලව සමාලෝචිත වර්ෂයේ දී හඳුනාගත යුතු ක්ෂය වියදමට සමාන වටිනාකමක් වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ අතිරික්තයේ හෝ ඌනතාවයේ හඳුනාගත් ප්‍රාග්ධන වියදම් ප්‍රදාන ලෙස ද අයභාරයෙහි පුනරාවර්ථන නොවන වියදම් සඳහා රජයෙන් කළ මාරු කිරීම් ලෙස ද දක්වා නොතිබුණු හෙයින් සමාලෝචිත වර්ෂයේ විස්තීර්ණ ආදායම හා වෙනත් විස්තීර්ණ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේදී ක්ෂය හඳුනා ගැනීමට කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය.

1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් ගිණුම් ශේෂ 05 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය හා උපලේඛන අනුව ශේෂය අතර රු.43,327,811 ක නොසැසඳීමක් පැවතුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	උපලේඛන යාවත් කාලීන කර ඒ පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන නිවැරදි කළ යුතුය.

1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
රු.26,982,070 ක් වූ පුස්තකාල පොත්වලට අදාලව විස්තරාත්මක උපලේඛණ ඉදිරිපත් නොකිරිම නිසා සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.	උපලේඛන ඉදිරිපත් කරන බව.	මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි සැපයීමට කටයුතු කළ යුතුය.

1.7 අනුකූල නොවීම්

1.7.1 **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) 2019 දෙසැම්බර් 24 දිනැති මහා නගර සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ නියෝග			
(i) 310	මහා නගර සභාව විසින් කුලියට දෙන ලද දේපළ සම්බන්ධයෙන් තොරතුරු පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පළාත් පාලන කොමසාරිස් නියම කළ ආකෘතියට අදාළ වූ ලේඛනයක පවත්වාගෙන යා යුතු වුවද සභාව එම විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී පළාත් පාලන කොමසාරිස් නියම කළ ආකෘතියට අදාළ වූ ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කරන බව.	මූල්‍ය හා පරිපාලන රීති අනුව කටයුතු කළ යුතුය.
(ii) 312	මීගමුව ප්‍රධාන බස්නැවතුම්පල අසල පිහිටි වැසිකිළි පද්ධතිය, රාජපක්ෂ අයිස්ක්‍රීම් හල, ඒත්තුකාල වෙරළ උද්‍යාන රථගාල හා වැසිකිළිය යන දේපළ බදු දීමට අදාළව ඇතිකර ගත් ගිවිසුම්වල මාසික කුලී මුදල් ගෙවිය යුතු බවට වූ කොන්දේසියක් ඇතුළත් වී නොතිබුණි.	ඉදිරියේදී කොන්දේසියක් ඇතුලත් කිරිමට කටයුතු කරන බව.	මූල්‍ය හා පරිපාලන රීති අනුව කටයුතු කළ යුතුය.
(iii) 395	වාර්ෂික බදු දීම/ කුලියට දීම සම්බන්ධයෙන් ලිත් වර්ෂයක් පදනම් කර ගත යුතු වුවත්, සභාව	විධිමත් ටෙන්ඩර් ක්‍රියාවලියක් යටතේ	මූල්‍ය හා පරිපාලන රීති අනුව කටයුතු කළ යුතුය.

	විසින් තැබෑරුම්වත්ත ඉඩම තාවකාලික රථවාහන නැවතුම්පලක් ලෙස 2014 වර්ෂයේ සිට එකම ආයතනයකට මාසයකට අඩු දින ගණනක් හා මාස කිහිපයක් සඳහා ද 2024 ජූලි 01 දින සිට 2025 දෙසැම්බර් 31 දින දක්වා වර්ෂ 1 1/2 ක කාල සීමාවකට ද බදු දී තිබුණි.	ටෙන්ඩර් කිරීමට කටයුතු කරන බව.

1.7.2 බදු අවශ්‍යතාවයට අනුකූල නොවීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ 2019 ජූලි 09 දිනැති අංක GIR/2019/03- 1 (Ins.cir) දරන චක්‍රලේඛය අනුව ගෙවන ලද එකතුකළ අගය මත බදු පිළිබඳ තොරතුරු එහි ආකෘතිය අනුව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත යැවිය යුතු වුවත් සැපයුම්කරුවන්ට අදාලව රු.41,055,077 ක යෙදවුම් මත බදු විස්තර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට යවා නොතිබුණි.	ඉදිරියේදී නිවැරදි කරන බව.	චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.192,294,551ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.204,958,275 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

නාගරික නොමසාරිස්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

		2024				2023			
	ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තු ගත ආදායම	බිල්කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තු ගත ආදායම	බිල්කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
		රු.'000	රු.'000	රු.'000	රු.'000	රු.'000	රු.'000	රු.'000	රු.'000
(i)	වරිපනම් හා බදු	200,986	256,886	209,067	205,584	167,173	196,520	167,191	227,696
(ii)	කුලී	335,008	103,674	103,738	38,338	88,791	86,354	86,354	39,103
(iii)	බලපත්‍ර ගාස්තු	20,653	28,649	28,657	831	15,956	23,997	24,060	2,298
(iv)	වෙනත් ආදායම්	918,066	727,063	728,846	13,042	828,788	824,451	829,385	15,692
		---------	----------	--------	---------	-------------	-----------	----------	---------
		1,474,713	1,116,272	1,070,308	257,795	1,100.708	1,131,322	1,106,990	284,789

2.2.2 කුලී

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කාමච්චෝඩය ඉරිදා පොළ පවත්වනු ලැබූ දිනයන්ට අදාළ රු. 2,371,000 ක් වූ හිඟ කුලී මුදල් බදුකරු විසින් සභාවේ තැන්පත් කර ඇති මුදලින් අයකර තිබුණත් ඒ සඳහා රු.22,452,225 ක දඩ මුදල සහ රු.23,710 ක මුද්දර බදු ගාස්තු අයකරගෙන නොතිබුණි.	අයකළ යුතු මුදල් බදුකරුගෙන් අයකර ගන්නා බව.	දඩ මුදල් හා මුද්දර බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	2024 වර්ෂයේ අදාළ ටෙන්ඩර්කරු විසින් සහන කාලයකින් පසු වාරික ගෙවීම් සිදුකිරීමේදී ඒ සඳහා සියයට 5 ක දඩ මුදල මත කාමච්චෝඩය ඉරිදා පොළ වෙනුවෙන් රු.782,550 ක් සහ කාමාච්චෝඩය බදාදා සතිපොළ වෙනුවෙන් රු.807,700 ක් වශයෙන් අයකර ගෙන නොතිබුණු අතර කාමාච්චෝඩය බදාදා සතිපොළ වෙනුවෙන් 2024 ජනවාරි 01 දින සිට 2024 ජුනි 30 දින දක්වා කාලපරිච්ඡේදයට අදාළ හිඟ පොළ වාරික වටිනාකම සඳහා අයකර ගත යුතු රු.13,882,969 ක් වූ දඩ මුදල හා රු.12,769 ක් වූ මුද්දර බද්ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	අයකළ යුතු මුදල් බදුකරුගෙන් අයකර ගන්නා බව.	දඩ මුදල් හා මුද්දර බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටුකිරීම

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අතුරු ව්‍යවස්ථා		
	මහා නගර සභා ආඥා පනතේ 267 හා 272 වගන්ති අනුව රථගාලක් පවත්වාගෙන යාම සහ ගාස්තු අය කිරීම සඳහා අතුරු ව්‍යවස්ථාවක් මගින් මහා නගර සභාව බලය ලබා ගැනීමක් සිදුකර ගත යුතු වුවද මීගමුව බල ප්‍රදේශයේ පරණ හලාවත පාරේ පාලම අසල සිට මුස්ලිම් පල්ලිය දක්වා මාර්ගයේ සහ කාමච්චෝඩය සතිපොල ඉදිරිපිට පවත්වාගෙන යනු ලබන රථගාල් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථාවක් පිළියෙල කර නොතිබුණි.	ඉදිරි වර්ෂයේ සිට සිදුකරන බව.	මහ නගර සභා ආඥා පනත අනුව අතුරු ව්‍යවස්ථා සකස්කර ගත යුතුය.
(ආ)	ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය		
	(i) මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) වගන්ති අංක 04, 96 සහ 100 අනුව සහ 2008 ජූලි 30 දිනැති බස්නාහිර පළාත් 2008 අංක 01 දරන නාගරික ඝණ	පිරිසිදු කිරීම් හා මහජනතා	නීති අනුව කටයුතු කර නගරය පවිත්‍රව

	අපද්‍රව්‍ය කළමනාකරණ රීති අනුව පොදු කාණු සහ මාර්ග පවිත්‍ර කිරීමේ කටයුතු ඍජුව හෝ වක්‍රව ඉටු කිරීම හෝ ඉටුකරවා ගැනීමේ වගකීම මහා නගර සභාවට පැවරී තිබුණත් එම කාර්ය ඉටු කිරීමට ක්‍රියා කර නොතිබුණි.	ව දැනුවත් කිරීම් සිදුකර ඇති බව.	තබා ගැනීමට ක්‍රියා කළ යුතුය.
(ii)	මීගමුව කොළඹ ප්‍රධාන මාර්ගයේ සහ නගර සභා බල ප්‍රදේශයට අයත් මාර්ගවල කාණුවල මඩ හා ප්ලාස්ටික් බෝතල් වැනි කසල වලින් අවහිර වීම හේතුවෙන් ජලය රැස්ව තිබීමෙන් ඩෙංගු වැනි බෝවන රෝග ව්‍යාප්තියෙන්ද, මහජනතාව පීඩාවට පත් වන බවද විගණනයට නිරීක්ෂණය විය.	සෞඛ්‍ය සේවකයන් ප්‍රමාණවත්ව නොමැති බැවින් ගැටළු ඇතිවන බව.	කාණු පද්ධතිය අඛණ්ඩව පිරිසිදුව පවත්වා ගනිමින් බෝවන රෝග වළක්වා ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා එකතුව රු.295,790,039 ක් වූ විවිධ ණයහිමි ශේෂ 18 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	ගබඩා ණයහිමි ශේෂ 7 ක් පමණක් නිරවුල් කිරීමට ඇති බව.	පැවැත්ම සොයා බලා ණයහිමි ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	1981 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා විවිධ ණයගැති ශේෂ 81 ක එකතුව රු.2,172,222 ක් සහ 1986 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා ගබඩා ණයගැති ශේෂ 39 ක එකතුව රු.693,676 ක් ලෙස මුළු එකතුව රු.2,865,898 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	නිරවුල් කිරීමට තොරතුරු සොයමින් පවතින බව.	ණයගැති ශේෂවල පැවැත්ම සොයා බලා නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	1991 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා එකතුව රු.879,975 ක් වූ අගරු චෙක්පත් 51 ක් සම්බන්ධව කටයුතු කර අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි.	නිරවුල් කිරීමට තොරතුරු සොයමින් පවතින බව.	අගරු චෙක්පත් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
(ඈ)	2021 පෙබරවාරි 01 දිනැති අංක LGD/10A/4/න.ගි/2019 දරන පළාත් පාලන කොමසාරිස්ගේ ලිපිය අනුව සියළු වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කළ යුතු වුවද, සභාව සතු ඉඩම් හා වෙනත් යටිතල පහසුකම් යන වත්කම් හඳුනාගෙන ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.	ගිණුම්ගත කරමින් පවතින බව.	වත්කම් හඳුනාගෙන ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කළ යුතුය.
(ඉ)	සභාව සතු ගොඩනැගිලි 26 ක වරිපනම් අය කිරීම සඳහා ආදායම් පරීක්ෂකවරුන් විසින් ලබාදී තිබූ රු.7,047,317 ක වාර්ෂික තක්සේරු වටිනාකම ප්‍රත්‍යාගණිත වටිනාකම ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම සම්බන්ධයෙන් ඉකුත් වර්ෂවලදීද විගණනයෙන් පෙන්වා දීමෙන් පසු තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු කරගන්නා බව විගණනයට දන්වා තිබුණද සමාලෝචිත වර්ෂයේදී ද එසේ සිදු කර නොතිබුණි.	ඉදිරියේ දී තක්සේරු කටයුතු සිදුකරන බව.	ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මහා නගර සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ නියෝග 317(i)(ii)(iii) සහ 398 ට අනුකූල නොවන පරිදි වරලත් තක්සේරුකරුවෙකුගේ තක්සේරු වාර්තාවක් පදනම් කර නොගෙන පරණ හලාවත පාරේ රථගාල මාසිකව රු.60,000 කට ද, කාමච්චෝඩය සතිපොල ඉදිරිපිට රථගාල මාසිකව රු.20,000 කට ද පැරණි බදුකරුවන්ගේ ඉල්ලීමට අනුව බදු ලබා දී, දිගින් දිගටම බදු කාලය දීර්ඝ කර ද තිබුණි.	2025 වර්ෂයේදී මිලගණන් කැඳවා බදු දීමට කටයුතු කර ඇති බව.	විධිමත් තක්සේරු වාර්තාවක් මත කටයුතු කළ යුතුය.
(ආ)	2017 ඔක්තෝබර් 23 දිනැති ලිපිය මගින් වසර දෙකක කාලයක් සඳහා තැබෑරුම්වත්ත රථගාල සඳහා මාසික කුලිය රු.220,000 ක් ලෙස තක්සේරු දෙපාර්තමේන්තුව තක්සේරු කර තිබිය දී 2018 ජනවාරි 01 දින සිට 2019 දෙසැම්බර් 31 දින දක්වා වූ කාලය සඳහා ආයතනයේ ඉල්ලීම මත රු 430,000 ක ගාස්තුවක් අයකර තිබීම හේතුවෙන් එම කුලිය සඳහා රු.4,850,000 ක ආදායමක් අහිමිවී තිබුණි. 2020 වර්ෂය සඳහා නව තක්සේරුවක් ලබාගත යුතු වුවත් නව තක්සේරුවක් ලබාගැනීමට ද කටයුතු කර නොතිබුණි.	ටෙන්ඩර් කළද කිසිවකු ඉදිරිපත් වී නොමැති බව.	නව තක්සේරුවක් ලබාගෙන ටෙන්ඩර් පටිපාටියට අනුකූලව බදු ලබාදීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2019 ඔක්තෝබර් 03 දින පැවති මහා සභාව විසින් සභාවට අයත් ස්ථානවල ආරක්ෂක සේවය සැපයීම සඳහා පුද්ගලික ආයතනයක් සමඟ ගිවිසුම් ගත වීමට තීරණය කර තිබුණි. නමුත් 2021 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වාම පෙර සේවා සැපයුම්කරුගේ ඉල්ලීම මත දිගින් දිගටම සේවා ගිවිසුම දීර්ඝකර තිබුණි.	ඉදිරියේදී ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුව බදු ලබා දීමට කටයුතු කරන බව.	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය.
(ඈ)	සෙනසුරාදා රාත්‍රී පොල බදු දීම සම්බන්ධ පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය		
	(i) 2019 වර්ෂයේ සිට බදු ලබා ගනු ලබන බදුකරු වෙතම පෙර වර්ෂයේ බදු මුදලට සියයට 5 ක මුදලක් වැඩි කරමින් දේපළ බදු දීමට මහා සභා සම්මුතිය මගින් පිළිගෙන 2022 වර්ෂයේ සිට 2024 ජුනි 30 දින දක්වා බදු දීම සිදු කර තිබුණු අතර, 2024 ජුලි 01 දින සිට වර්ෂ 1½ කාලයක් සඳහා ටෙන්ඩර් කර තිබුණි. ඒ අනුව රු.18,960,000 ක් හා රු.18,000,000 ක් ලෙස වැඩිම ලංසු වටිනාකම් ඉදිරිපත් කර තිබියදි රු.17,680,000 කට ඉදිරිපත් කළ තෙවන වැඩිම ලංසු වටිනාකම සඳහා ටෙන්ඩරය ප්‍රදානය කර තිබුණි.	2026 සිට ලිත් වර්ෂයක් පදනම් කරගෙන බදු දෙන බව.	ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව බදු ලබාදීමට ක්‍රියා කළ යුතුය.

(ii)	බදු ගිවිසුමෙහි කොන්දේසි අංක 23 අනුව උපලේඛන 02 හි දැක්වෙන භූමි සීමාව තුල පමණක් පොළ පැවැත්වීමටත්, ගාස්තු අයකිරීමටත් එකඟ වී තිබූ නමුත් ලංකා බැංකුව අසලසිට පැරණි රීගල් සිනමා ශාලා භූමිය දක්වා වූ තාවකාලික කඩවලින්ද, සෙනසුරාදා දිනවලදි එම බදුකරු විසින් ගාස්තු අයකරනු ලබන බවත් එම දිනවලදී එම තාවකාලික කඩවලින් සභාව විසින් ගාස්තු අය නොකරන බවත් අනාවරණය විය.	බදුකරු දැනුවත් කර ඇති බව.	බදු ගිවිසුම් කොන්දේසි අනුව කටයුතු කළ යුතුය.
(iii)	සෙනසුරාදා රාත්‍රි පොළ සඳහා බදු ගිවිසුමේ කොන්දේසි අංක 08 අනුව කොන්දේසි අංක 02 මගින් ගිවිස ගන්නා පොළ ගාස්තු, පොළ දිනට පසුව එළඹෙන දින 10 ඇතුළත ගෙවීමට අපොහොසත් වුවහොත් දින 10 ක සහනදායි කාලසීමාව හැර එළඹෙන දිනයේ සිට දිනකට සියයට 5 ක් බැගින් දඩ මුදලක් ද සමග ගෙවීමට දෙවන පාර්ශවය එකගවී තිබූ නමුත් සභාව වෙත 2024 වර්ෂය සඳහා බදු මුදල් ගෙවීමේදී ඉහත කාලසීමාව ඉක්ම වූ සති 21 ක් වෙනුවෙන් අයකළ යුතු එකතුව රු.3,734,375 ක් වූ දඩ අයකිරීමට සභාව කටයුතු කර නොතිබුණි.	හිඟ බදු ගෙවන ලෙස බදුකරුවන් දැනුවත් කර ඇති බව.	බදු ගිවිසුම අනුව මුදල් කාලීනව අයකර ගැනීමට සහ හිඟ ශේෂ දඩ මුදල් සමඟ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඉ)	මීගමුව නගරයේ හඳුනාගන්නා ලද ස්ථාන හතරක භූමි කොටස් 49 ක් තාවකාලික කඩ කාමර ඉදිකර ගැනීම සඳහා 2024 දෙසැම්බර් 5 දින සිට 2025 ජනවාරි 5 දින දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් බදු ලබාදීමේදී, මහා නගර සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ නියෝග 316(i) , 318 ,320, 322 (iii) 350, 353, 370 සහ 377 අනුව කටයුතු කර නොතිබුණි.	2025 දී නියෝග අනුව කටයුතු කරන බව.	මූල්‍ය පරිපාලන නියෝග අනුව කටයුතු කළ යුතුය.
(ඊ)	ග්‍රීන් පාර්ක් පිටිය ඉදිරිපිට අංක 10 සහ 13 කඩකාමර සහ IOC ෂෙඩ් එක ඉදිරිපිට අංක 06 කඩකාමරය වෙනුවෙන් පිළිවෙලින් සභාවට ලැබී තිබූ ආදායම රු.60,000 ක්, රු.55,000 ක් සහ රු.65,000 ක් වුවද එම කඩකාමර බදු ලබාගත් ලේඛනගත පුද්ගලයින් වෙනත් බාහිර පාර්ශවයකට රු.100,000 ක් සහ රු.140,000 ක් බැගින් අතුරු බදු ලබාදී තිබුණි.	සභාවට ඒ සම්බන්ධව වාර්තා වී නොමැති බව.	පනතේ විධි විධාන අනුව අතුරු බදු දෙන්නේ නම් සභාවේ අවසරය ලබා ගත යුතුය.
(උ)	ඒත්තුකාල වෙරළ උද්‍යානය නාගරික සංවර්ධන අධිකාරියට පවරා දීමට අවශ්‍ය කටයුතු කඩිනම් කරන ලෙසට මහා සභාව 2023 ජනවාරි 10 දින යෝජනා කර තිබියදී හා මීගමුව ප්‍රාදේශීය ලේකම්ගේ ලිපියක් මගින් මෙම දේපල නාගරික සංවර්ධන අධිකාරියට පැවරීමට අදාළ නිර්දේශ වාර්තා ඉඩම් කොමසාරිස් වෙත යොමු කර තිබියදී ඒ සම්බන්ධයෙන් සැලකිලිමත් නොවී මෙම දේපල 2024 ජූලි 01 දින සිට 2025 දෙසැම්බර් 31 දින දක්වා වූ කාලසීමාවකට අදාළව ටෙන්ඩර් කිරීමට කටයුතු කර තිබුණි.	2023 ජූලි 01 සිට 2024 ජුනි 30 දක්වා බදු ලබාදී ඇති අතර 2023 සැප්තැම්බර් 12 දිනැති ලිපිය මඟින් තක්සේරුව ලබාදී ඇති බව.	තක්සේරු වටිනාකම් මත බදු ලබාදී ආදායම් වැඩිකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඌ)	නත්තල් සමයේ මීගමුව නගරය තුල තාවකාලික කඩ සඳහා භූමිය බදු ලබාදීම සම්බන්ධ පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.		

(i) මහා නගර සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ නියෝග 398 ප්‍රකාරව දේපල සම්බන්ධයෙන් ලංසු වටිනාකම් තීරණය කිරීම වරලත් තක්සේරුකරුවකුගේ තක්සේරු වාර්තාවක් පදනම් කරගනිමින් කළයුතු වුවත් වාර්ෂිකව දෙසැම්බර් මාසය සඳහා තාවකාලිකව බදු ලබාදෙනු ලබන මෙම දේපල සම්බන්ධයෙන් 2024 පෙබරවාරි 15 දිනැති බස්නාහිර පළාත් පාලන කොමසාරිස්ගේ ලිපිය අනුව 2024 වර්ෂයේ දෙසැම්බර් මස නත්තල් කාලය සඳහා තාවකාලික කඩ කාමර බදු ලබාදීමේදී, රජයේ තක්සේරුවක් ලබා නොගෙන මහා නගර සභාව විසින් තාවකාලිකව බදු දුන් අඩි 10×10, 05×10 , 08×08 සහ 6×10 ලෙස භූමි ප්‍රමාණ සඳහා රු.40,000 ක සිට රු.100,000 ක් දක්වා අවම වටිනාකම් දක්වමින් ටෙන්ඩර් ලබාදී තිබූ අතර සභාව විසින් තාවකාලික කඩ සඳහා ගිවිසුම්ගත වීමක් ද සිදුකර නොතිබුණි.	තාවකාලික තක්සේරුවක් ලබාගෙන එම ගාස්තු නාගරික කොමසාරිස් විසින් අනුමත කර ඇති බව.	වරලත් තක්සේරුකරුවකුගේ තක්සේරු වාර්තාවක් පදනම් කරගත යුතු අතර ගිවිසුම් ගත වීමටද කටයුතු කළ යුතුය.
(ii) දුම්රියපල ඉදිරිපිට තාවකාලික අංක 1 සහ 2 යන කඩ කාමර දෙක සඳහා මිල ගණන් කැඳවීමේදී අතපසුවීමක් සිදුවී තිබියදී ඒ සම්බන්ධයෙන් කිසිදු සැලකිල්ලක් නොදක්වා ටෙන්ඩර් කමිටු හෝ ඇගයීම් කමිටුවලින් හෝ වෙනත් ආකාරයක සාධාරණීකරණ වාර්තාවක් හෝ ලබාගැනීමකින් තොරව නාගරික කොමසාරිස් විසින් ටෙන්ඩර්කරුවන් ඉදිරිපත් කර ඇති මිල ගණනෙහි සාමාන්‍ය ගණනය කර අදාල මුදල ලබාගන්නා ලෙස දැනුම් දී තිබුණි. එමනිසා ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කළ වැඩිම වටිනාකමට ලබාදීමෙන් සභාවට ලබාගත හැකිව තිබූ රු.135,000 ක ආදායමක් අහිමි වී තිබුණි.	ඉදිරිපත් කළ මිල ගණන් හි සාමාන්‍ය මත ගාස්තු අයකිරීමට තීරණය කළ බව.	සභාවට ලැබිය යුතු උපරිම ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතුය.

3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
පුස්තකාලය සඳහා පළමු මහලද බිම්මහල වාණිජ කටයුතු සඳහාද භාවිතයට ගැනීමට 2017 වර්ෂයේ සැලසුම් කර තිබුණද 2025 මැයි 18 වන දිනවන විටද ඉදිකිරීම් ආරම්භ කර වර්ෂ 09 ක් ගත වුවද මෙම ගොඩනැගිල්ලෙන් අපේක්ෂිත මහජන සේවා ලබාදීම ආරම්භ කර නොතිබුණි.	රජයේ තක්සේරුව ප්‍රමාද වීම මත වාණිජ කොටස බදු දීම ප්‍රමාද වී ඇති බව.	මහජන දේපළ උපරිම කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුය.

3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය හා ප්‍රසම්පාදන අත්පොතෙහි 4.2.1 ආකෘතිය අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු අතර මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1(ආ) අනුව අවම වසර 3 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ලැයිස්තු ගත කර තිබිය යුතුය. නමුත් අස්ථිත්වය විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණු අතර 2020 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා පිළියෙල කර තිබූ වාර්ෂික ප්‍රසම්පාදන සැලසුම් තුල ආරක්ෂක සේවාව ලබා ගැනීම සඳහා වූ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඇතුලත් කර නොතිබුණි.	2025 දී ප්‍රසම්පාදන කමිටුවක් පත්කර කටයුතු කරන බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය.
(ආ)	2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.4.1 අනුව ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණික ඇගයීම් කමිටු සම්පූර්ණ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා වගකිව යුතු වුවද රාජපක්ෂ උද්‍යානය හා එම පරිශ්‍රය සඳහා ආරක්ෂක සේවා සැපයීමට ආයතනයක් තෝරාගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා ප්‍රසම්පාදන කමිටුවක් පත්කර නොතිබුණි.	2025 දී ප්‍රසම්පාදන කමිටුවක් පත්කර කටයුතු කරන බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය.
(ඇ)	ආයතනයක් විසින් වොට් 40 LED බල්බ් වසර 2 ක වගකීම් කාලයකට යටත්ව ඒකකයක් රු. 2,410 ක මිළකට ඉදිරිපත් කර තිබියදී 2024 ජනවාරි 01 දින සිට 2024 අගෝස්තු 30 දින දක්වා කාලය තුල සභාව විසින් හා වොට් 40 LED බල්බ් 1,175 ක් ඒකකයක් රු. 4,140 ක ඉහළ මිළකට වෙනත් ආයතනයකින් මිලදී ගෙන රු. 2,032,750 ක් වැඩිපුර ගෙවීමක් සිදුකර තිබුණි.	I 65 තාක්ෂණයෙන් යුතු බල්බ තෝරාගෙන ඇති බව.	පිරිවැය ප්‍රතිලාභ පිළිබඳවද මිලදී ගැනීමේදී අවධානය යොමුකළ යුතුය.

3.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වාණිජ පහසුකම්වලින් යුත් දෙමහල් පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීමෙහි, ඉතිරි වැඩ කොටස් නිමකිරීම සම්බන්ධයෙන් සිදු කරන ලද පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.		
(i)	වාණිජ පහසුකම්වලින් යුත් දෙමහල් පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම් සිදුකරන ලද මුල් කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් ගිවිසුම් අවලංගු කළද රු.7,855,091 ක් වූ කාර්යසාධන බැදුම්කරය මුදල් කර නොගැනීම මත සහා අරමුදලට	කාර්යසාධන ඇපකරය අවලංගු වී ඇති අතර අත්තිකාරම් ඇපකරය මුදල්	ගිවිසුම් කඩ කල විට ගිවිසුම අනුව කටයුතු කිරීමට පියවර ගත යුතුය.

	ලැබියයුතු රු.7,855,091 ක මුදල හා 2019 නොවැම්බර් 20 සිට ඒ මත ප්‍රතිලාභ අහිමි වී තිබුණි.	කිරීමට කටයුතු කර ඇති බව.	
(ii)	ඉදිකිරීම් සඳහා උපදේශන ආයතනය හා සුදුසු කොන්ත්‍රාත්කරුවෙකු, විනිවිදභාවයෙන් ලබා නොගැනීමෙන් හා ඉදිකිරීම් වැඩ අධීක්ෂණය අකාර්යක්ෂම වී රු.157,101,803 කට 2017 ජුනි 23 දින ඉදිකිරීම් අවසන් කළ යුතුව තිබූ පුස්තකාල ගොඩනැගිල්ල අතරමඟ නතර කර ඒ අනුව 2024 සැප්තැම්බර් 09 දින ඉතිරි කොටස් සම්පූර්ණ කරන ලද කොන්ත්‍රාත්කරුට ඉහල උද්ධමනය මත මිල විචලනයන්ද සහිතව රු.206,393,566 ක්ද ලෙස සම්පූර්ණ දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීමට රු. 313,410,992 ක් ගෙවීමට සිදුවී තිබුණි.	අදාල ආයතන ටෙන්ඩර් පටිපාටිය අනුව තෝරාගත් බව.	අකාර්යක්ෂමතා නිරීක්ෂණය වී තිබියදී කොන්ත්‍රාත්කරුට සහ උපදේශන ආයතනයට ගෙවීම් කිරීමට හේතු සොයා බලා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	කාමච්චෝඩය ඩඩ්ලි සේනානායක මධ්‍යම වෙළඳපොල ගොඩනැගිල්ල ඉදිකිරීම (අදියර 01) සම්බන්ධ පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.		
(i)	2023 ජනවාරි 18 දින රු.479,642,845 ක වටිනාකමකට හා 2023 ඔක්තෝබර් 12 දින ඉදිකිරීම් නිම කිරීමට ගිවිසුම්ගතවී තිබුණු මහල් 3 කින් යුතු කොන්ත්‍රාත්තුවේ වැඩ ප්‍රමාණය මහල් 2 කට සීමා කර තිබිණි. නමුත් ගිවිසුම්ගත මුළු මුදල පදනම් කරගෙන රු.99,240,517 ක අත්තිකාරම් ගෙවා තිබුණි.	බිල්පත්වලින් කොටස් වශයෙන් අයකරන බව.	ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අතිරේකය අනුව හා කොන්ත්‍රාත් ගිවිසුම් කොන්දේසි අනුව කටයුතු කළ යුතුය.
(ii)	කොන්ත්‍රාත් ගිවිසුම් කොන්දේසි 8.7 අනුව සාධාරණ හේතු මත කොන්ත්‍රාත් කාලය දීර්ඝ කළ යුතු වුවත් දක්වා ඇති හේතුන් පිළිගත නොහැකි බැවින් දින 382 ක් සඳහා දිනකට රු.119,911 ක් බැගින් රුපියල් මිලියන 45.8 ක ප්‍රමාද ගාස්තු කොන්ත්‍රාත්කරුගෙන් අය කළ යුතුව තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී ප්‍රමාද ගාස්තු අයකිරීමට කටයුතු කරන බව.	කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි අනුව ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(iii)	ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය මගින් (CIDA) 2009 ජුනි නිකුත් කරන ලද අංක (I.CTAD/1D/04) දෙවන සංස්කරණ ප්‍රකාශයට අනුව රක්ෂණ හා ආරක්ෂක ඇපකර ඉදිරිපත් කිරීමේදී එම ලේඛන ඉදිරිපත් කිරීමේ තත්‍ය වියදම හා ඒ මත සියයට 5 ක මුදලක් ගෙවියයුතු වුවද එම සීමාව නොතකා මූල්‍ය ආයතනයට, කොන්ත්‍රාත්කරුට වූ පිරිවැය ලබා නොගෙන විෂයය අංක B11, B12 මගින් පිළිවෙලින් රු.734,085ක් හා රු.1,404,335 ක් ගෙවා තිබුණි. එලෙසම ප්‍රාථමික වැඩ B17 යටතේ වෙනත් පාර්ශවයන්ට සිදුවන හානි සිදුවී ඇත්ද යන්න සනාථ කිරීමකින් තොරව රු.175,000 ක් ගෙවා තිබුණි.	උපදේශක ආයතනයෙන් තොරතුරු විමසා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කරන බව.	වැඩිපුර ගෙවීම් කිරීමට හේතු සොයා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.
(iv)	කොන්ත්‍රාත්කරු විසින් ලබාගෙන තිබූ රු.488,776,124 ක අවදානම් රක්ෂණය සඳහා රක්ෂණ සමාගමට ගෙවිය	උපදේශක ආයතනයෙන්	වැඩිපුර ගෙවීම් කිරීමට හේතු

යුතු මුදල රු.308,887 ක් වී තිබුණද විවිධ රක්ෂණ වර්ග යටතේ රු1,367,615 ක් උපදේශන ආයතනය මගින් සහතික කර ගෙවීමට කටයුතු කර තිබුණි. තවද 2024 දෙසැම්බර් 31 දින දක්වා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට අනුව රක්ෂණ ආවරණය දීර්ඝකිරීමක්ද කර නොතිබුණි.	තොරතුරු විමසා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කරන බව.	සොයා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.
(v) 2025 පෙබරවාරි 18 දින සිදුකළ භෞතික විගණන පරීක්ෂා කිරීම් අනුව උක්ත ඉදිකිරීමට අදාලව බිල් අංක 07 දක්වා ගෙවීම් කර තිබූ වැඩ විෂයයන් හා සිදුකර තිබූ වැඩ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.		
• වැඩ විෂයය අයිතම B18 යටතේ වැඩබිම් ඉංජිනේරුවරයාට පහසුකම් සඳහා වායු සමනය කරන ලද පුද්ගලයින් දස දෙනෙකුට ප්‍රමාණවත් වර්ග මීටර් 100 කට නොඅඩු තාවකාලික කාර්යාල ගොඩනැගිල්ලක් පවත්වාගෙන යාම සහ ඉවත් කිරීම වෙනුවෙන් රු.378,450 ක් ගෙවා තිබුණද භෞතික පරීක්ෂා කිරීම් අනුව එය අඩි 7.5×20 දිග පළල එනම් වර්ග මීටර් 13.5 ක වැසිකිලි නොමැති තාවකාලික කාර්යාල පරිශ්‍රයක් පමණක් විය.	උපදේශක ආයතනයෙන් තොරතුරු විමසා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කරන බව.	වැඩිපුර ගෙවීම් කිරීමට හේතු සොයා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.
• වැඩ විෂයය අයිතම B 21 යටතේ වායුසමනය කරන ලද 20 දෙනෙකුට ප්‍රමාණවත් රැස්වීම් ශාලාවක් ගොඩනැගීම, නඩත්තු කිරීම හා ඉවත් කිරීම වෙනුවෙන් රු.233,750 ක් ගෙවා තිබුණද එවැනි ගොඩනැගිල්ලක් වෙන්කර හෝ භාවිතා කර නොතිබුණු අතර ඉදිකිරීම් සම්බන්ධ රැස්වීම් හා සාකච්ඡා මහා නගර සභා කාර්යාලයේ පවත්වා තිබුණි.	උපදේශක ආයතනයෙන් තොරතුරු විමසා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කරන බව.	වැඩිපුර ගෙවීම් කිරීමට හේතු සොයා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.
• වැඩ විෂයය B19 යටතේ දුරකථන, විදුලිය, ෆැක්ස්, ජලය සැපයීම වෙනුවෙන් රු.199,750 ක් ගෙවා තිබියදී වැඩ විෂයය B20 මගින් සංනිවේදනය සේවා භාවිතය වෙනුවෙන් රු.66,000 ක් ගෙවා තිබුණි.	උපදේශක ආයතනයෙන් තොරතුරු විමසා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කරන බව.	වැඩිපුර ගෙවීම් කිරීමට හේතු සොයා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.
• වැඩබිම් කාර්ය මණ්ඩලයට විවේක ගැනීම් හා වැසිකිළි සහිත තාවකාලික කාර්යාල ගොඩනැගිල්ලක් වෙනුවෙන් රු.780,030 ක් ගෙවා තිබුණද වර්ග මීටර් 13.5 ක කැබින් එකක්, වැසිකිලි හා විවේක ගතහැකි පහසුකම් රහිතව තිබුණු බවත් එයද විගණිත දින වූ 2025 පෙබරවාරි 18 දින වන විට ගිවිසුම්කාලය අවසන් වී නොතිබියදී ඉවත් කර ගෙන තිබූ බවත් විගණනයට අනාවරණය විය.	උපදේශක ආයතනයෙන් තොරතුරු විමසා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කරන බව.	වැඩිපුර ගෙවීම් කිරීමට හේතු සොයා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.

• වාස්තු සැලැස්මේ දැක්වෙන පරිදි ක්ෂේත්‍ර වර්ගඵලය දැක්විය යුතු වුවද එහි කිසිවක් සටහන් නොකර ගබඩාව ලෙස භාවිතා කිරීමට ඉන් රු.225,000 ක් ගෙවා තිබුණි.	උපදේශක ආයතනයෙන් තොරතුරු විමසා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කරන බව.	වැඩිපුර ගෙවීම් කිරීමට හේතු සොයා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.
• වැඩ විෂය අයිතම B 28 අනුව මුළුතැන්ගෙයක්, ආපනශාලාවක් හා විවේකාගාරයක් සඳහා කාමරයක් කාර්යමණ්ඩලයට සැපයීම වෙනුවෙන් රු.229,500 ක් ගෙවා තිබුණද එවැනි පරිශ්‍රයක් නොතිබූ අතර කාර්යමණ්ඩල විවේකාගාරය යන්න සඳහා වැඩ විෂයය B 26 යටතේද ගෙවා තිබුණි.	උපදේශක ආයතනයෙන් තොරතුරු විමසා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කරන බව.	වැඩිපුර ගෙවීම් කිරීමට හේතු සොයා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.
• වැඩ විෂය B 26 යටතේ ඉදිකිරීම් කාර්යමණ්ඩලය සඳහා සනීපාරක්ෂක කටයුතු හා කාර්යමණ්ඩලයේ ප්‍රවාහන වියදම් දක්වා තිබියදී වැඩ විෂයය B 29 යටතේද රු.325,600 ක් ගෙවා තිබුණි.	උපදේශක ආයතනයෙන් තොරතුරු විමසා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කරන බව.	වැඩිපුර ගෙවීම් කිරීමට හේතු සොයා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.
• වැඩ විෂයය B 33 සිට B 42 යටතේ කොන්ත්‍රාත්කරු පහසුකම්, ඉංජිනියර් පහසුකම් කොන්ත්‍රාත් කළමනාකරණය හා සුපරීක්ෂාකරණය යටතේ නේවාසික, ඉංජිනේරු, තත්ත්වපාලක ඉංජිනේරු, වැඩබිම් සුරක්ෂිත නිලධාරි, තාක්ෂණික නිලධාරි විදුලි, තාක්ෂණික නිලධාරි වායු සමීකරණ, ප්‍රමාණ සමීක්ෂණ, සැලසුම් ශිල්පී, ඉදිකිරීම් සුපරීක්ෂක (ෆෝමන්) සහ අතිරේක තාක්ෂණික නිලධාරි වෙනුවෙන් දක්වා තිබූ රු.6,190,000,000 ක් අතරින් රු.4,256,550 ක් වෘත්තිකයන් පිළිබඳ තොරතුරු සහ එම වෘත්තිකයන් මෙම ඉදිකිරීම් සංවර්ධනයට දායක වූ බවට තහවුරු කරගැනීමකින් තොරව ගෙවා තිබුණි.	උපදේශක ආයතනයෙන් තොරතුරු විමසා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කරන බව.	වැඩිපුර ගෙවීම් කිරීමට හේතු සොයා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය..
• ප්‍රාරම්භක වැඩ විෂය B 43 හා B 44 යටතේ සැලසුම් (Setting out) සඳහා රු.316,800 ක් හා රු.154,000 ක් ගෙවා තිබූ අතර, ප්‍රගති වාර්තා, තත්ත්ව පාලන පරීක්ෂක වාර්තා ආදිය ඉදිරිපත් කර නොතිබුණද වැඩ විෂයය අංක B 45 සිට B 49 යටතේ රු.843,200 ක් ද ගෙවා තිබුණි. එලෙසම සෞඛ්‍ය, ආරක්ෂණ හා පාරිසරික මනාව පුහුණුව ලත් වෘතිකයෙකු යොදවන බව ප්‍රකාශ කළද ඒ අනුව කටයුතු නොකර වැඩ විෂයය B 50 මගින් රු.198,000 ක් ද උපකරණ භාවිතා කිරීම වෙනුවෙන් ඉදිකිරීම් මිල තුල අන්තර්ගත වී තිබුණද වැඩ විෂයය B 66 මගින් රු.520,000 ක්ද, වැඩ විෂයය B73 මගින් ප්‍රවේශ මාර්ග මඩවලින් තොරව සැකසීම හා එවැනි	උපදේශක ආයතනයෙන් තොරතුරු විමසා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කරන බව.	වැඩිපුර ගෙවීම් කිරීමට හේතු සොයා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.

කටයුතු සඳහා සේදීමේ බොක්කක් සැපයීම සහ සහතික කිරීම යටතේ එවැනි තත්ත්ව ඇති වී වියදම් දරා ඇති බව තහවුරු කර නොගෙන රු.231,000 ක් ද ගෙවා තිබුණි. එලෙසම වැඩ විෂය B74 යටතේ තාවකාලික හදිසි පදික වේදිකා ඉදිකිරීම් තත්ත්වයන් ඇතිවී නොතිබියදී රු.162,500 ක් ගෙවා තිබුණි.		
• භූමියේ යෝග්‍යතාව පරීක්ෂා කිරීම හා පාංශු පරීක්ෂණ වාර්තාව ලබාගැනීම වෙනුවෙන් රු.507,850 ක් 2018 ජුනි 07 දින ගෙවා තිබුණද එවැනි ඉදිකිරීමක් සිදුනොවුන බැවින් සභා අරමුදලට සිදුවූ පාඩුවක් බව විගණනයට නිරීක්ෂණය විය.	උපදේශක ආයතනයෙන් තොරතුරු විමසා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කරන බව.	වැඩිපුර ගෙවීම් කිරීමට හේතු සොයා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.

3.7 හඳුනාගත් පාඩු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාව සතු තලාහේන මාතෘ සායනය පිහිටි භූමියේ තලාහේන උපකාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2022 දෙසැම්බර් 10 දින සිට 2025 මැයි 30 දින දක්වා ආණ්ඩුකාර අනුමැතියක් ලබාගැනීමකින් හෝ කිසිදු ඉදිකිරීමක් සිදුකිරීමකින් තොරව සහ උපදේශක ආයතනයෙන් අත්සන් කරන ලද වාර්තාවක් ලබාදීමෙන් තොරව උපදේශන ගාස්තු ලෙස රු.3,500,000 ක් සහ පස් පරීක්ෂණ ගාස්තු වශයෙන් රු.318,734 ක් ලෙස එකතුව රු.3,818,734 ක් ගෙවා තිබීම හඳුනාගත් පාඩුවක් විය.	පිළිතුරක් ලබාදී නොමැති බව.	ඉදිකිරීමක් සිදුකර නොතිබියදී ගෙවීම් කිරීමට හේතු සොයා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.

3.8 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට සභාවේ කාර්යමණ්ඩලය තුල ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 6 ක්ද, තෘතීය මට්ටමේ පුරප්පාඩු 3 ක්ද, ද්විතික මට්ටමේ පුරප්පාඩු 42 ක් ද, ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 36 ක් ද හා තනතුරු 01 ක අතිරික්තයක්ද විය.	ජ්‍යෙෂ්ඨ මට්ටමේ තත්‍ය සේවක සංඛ්‍යාව 11 ක් සහ ද්විතික මට්ටමේ තත්‍ය සේවක සංඛ්‍යාව 185 ක් බව.	පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	ආපදා , දේපල හා පාපැදි ණය ලබාගත් නිලධාරීන් 563 දෙනෙකුගෙන් 2024 දෙසැම්බර් 31 දිනට රු.105,481,400 ක් අයවිය යුතුව පැවතුණි. ඉන් රු.1,704,976 ක් සේවය හැරගිය, විශ්‍රාමගිය, මියගිය හා ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතුව පැවති අතර නිලධාරීන් 21 දෙනෙකුගෙන් අයවිය යුතු වර්ෂයකට වඩා පැරණි රු.64,485 ක ණය ශේෂය සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	අයකර ගැනීමට පියවර ගෙන ඇති බව.	ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.